# <u>අන්තර් පළාත් සිසුසැරිය සේවා ආරම්භ කිරීමේ ක්‍රමවේදය</u>

1. අන්තර් පළාත් සිසුසැරිය සේවා ආරම්භ කිරීම සඳහා සෘජුවම ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ලැබෙන ඉල්ලීම් සහ පළාත් ප්‍රවාහන අධිකාරී නිර්දේශ සමග පළාත් ප්‍රවාහන අධිකාරී මගින් යොමු කරනු ලබන ඉල්ලීම් CR පොතක (ගමනාන්ත පාසල අනුව පිටු වෙන් කරන ලද) ලේඛන ගත කර (මෙම ලේඛනය ලේඛනය අංක 01 ලෙස පවත්වාගෙන යාම) ඔහු හෝ ඇයගේ ඉල්ලීම ලේඛනගත වූ අනු අංකය ඔවුන් වෙත එදිනම ලබාදීම.
2. සිසුසැරිය සේවා ආරම්භ කිරීම සඳහා වන මූලික ලියවිලි වන දරුවන්ගේ නාම ලේඛන (විදුහල්පති සහතික කළ), ගමන් මාර්ගයේ දළ සටහන දුරත් සමග, බස්රථයක් දැනටමත් මිලදී ගෙන ඇත්නම් ඒ සම්බන්ධ ලියවිලි, පාසල් වල විදුහල්පතිවරුන්ගේ ඉල්ලීම් ලිපි ඉදිරිපත් කරන ලෙස ඉල්ලීම්කරුවන් දැනුවත් කිරීම.
3. අවශ්‍ය වුවහොත් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් එම ඉල්ලීම් අදාල පාසල් වල විදුහල්පතිවරුන් වෙත යොමුකර අදාල මාර්ගයේ ගමන්කිරීමට සිටින දරුවන් සංඛ්‍යාව පිළිබඳ වාර්තාවක් ලබා ගැනීම.
4. එම ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබන සේවාව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් දැනටමත් නිකුත් කර ඇති අන්තර් පළාත් වලංගු මගී සේවා අවසර පත්‍රයක් පදනම් කරගෙන සිදුකළ හැකිනම් ඉල්ලීම් කර ඇති අනුපිළිවෙලට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ සිසුසැරිය සේවාව සඳහා ගිවිසුම්ගත වීම.
5. එසේ නොමැතිනම් ඉහත මූලික ලියවිලි ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ලැබුණු පසු ඉල්ලීම් ලැබුණ අනුපිළිවෙලට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර සිසුසැරිය සේවාවේ පමණක් ධාවනය කිරීමට සිසුසැරිය අවසර පත්‍රයක් නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.
6. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ සේවා වල ඉල්ලුම්කරුවන්ට GPS උපාංගය සහිත බස්රථයක් ඉදිරිපත් කරන ලෙස (කහ වර්ණය ආලේපිත) ලිඛිතව දැනුම් දීම. දැනුම් දුන් දිනයේ සිට මාසයක කාලයක් මේ සඳහා ලබා දීම.
7. ඉල්ලුම් කරන අවස්ථාව වන විට බස්රථයක් හිමි අයෙක් නම් ගිවිසුම්ගත වූ දිනයේ සිට මාස තුනක් ඇතුලත බස්රථය කහ වර්ණ ගැන්වීම සඳහා ලිඛිත පොරොන්දුවක් ලබාගෙන සිසුසැරිය අවසර පත්‍රයක් නිකුත් කිරීම.
8. එම සිසුසැරිය අවසර පත්‍රය වසරක වලංගු කාලයක් සඳහා රු. 3000.00ක වාර්ෂික මුදලකට නිකුත් කිරීම සහ වාර්ෂිකව රු.3000.00 බැගින් අයකර වලංගු කාලය දීර්ඝ කිරීම.
9. ඉහත ලේඛන වලට අමතරව සාමාන්‍ය මගී සේවා අවසර පත්‍රයක් නිකුත් කිරීමේදී ලබා ගන්නා ලේඛනද මේ සඳහාද ලබා ගැනීම.
10. අන්තර් පළාත් සිසුසැරිය සේවාවන් සඳහාද එක් පසෙකට සම්පූර්ණ දුර කි.මී. 55 දක්වා වන මාර්ග සඳහා සිසුසැරිය අවසර පත්‍ර නිකුත් කිරීම සහ සහනාධාර ගෙවීම්කරනු ලබන මුලු දුර දිනකට කි.මී. 110 ක් ලෙස ගිවිසුම්ගත වීම.
11. එම සිසුසැරිය අවසර පත්‍රය පදනම් කරගෙන සිසුසැරිය ව්‍යාපෘතියට ඇතුලත් කර ගැනීම සඳහා වසර තුනක් සඳහා වලංගු වන පරිදි ගිවිසුම් අත්සන් කිරීම සහ සේවාවවේ සාර්ථකත්වය හා අවශ්‍යතාවය මත වසර තුනෙන් තුන යාවත්කාලීන කිරීම.
12. දැනට සිසුසැරිය සේවාව සඳහා පවතින සියලු කොන්දේසි මෙම සේවාවන්ට අදාල වන පරිදි සිසුසැරිය සේවා ගිවිසුම පවත්වාගෙන යාම.

13. අන්තර් පළාත් සිසුසැරිය සේවා සඳහා ගෙවීම් කිරීම- පත්කර ගන්නා ලද පාසල් බලධාරීන් (වැඩිහිටි පාසල් දරුවන් හෝ ගුරුභවතුන්) විසින් බස්රථය දිනපතා නියමිත වේලාවට ධාවනය වූ බවට ලබාදෙන තහවුරුව මත ගමනාන්ත පාසලේ විදුහල්පති විසින් සහතික කරන ලොග් පත්‍රය හා GPS වාර්තා පදනම් කරගෙන ගෙවීම් කිරීම. ගෙවීම් කිරීමේ අනෙකුත් සියලුම කොන්දේසි මෙම සේවාවන් සඳහා ද එලෙසම අදාල කර ගැනීම.

14. එක් සේවාවකට ඉල්ලුම්කරුවන් දෙදෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත් වුවහොත් ලේඛනගත වූ අනුපිළිවෙල අනුව අවස්ථාව ලබාදීම. තවද එකම මාර්ගයට හෝ එම මාර්ගය හරහා ධාවනය වන සේවාවක් සඳහා ඉල්ලීම් කිහිපයක් ලැබුණු විට ඉහත පියවර අනුගමනය කරගෙන පළමු ඉල්ලුම්කරුට අවස්ථාව ලබා දීමටත් ඉන්පසු එම මාර්ගයේ හෝ ඒ හරහා ධාවනය වන මාර්ගයේ තව දුරටත් දරුවන්ට ප්‍රවාහන අවශ්‍යතාවයක් පවතින්නේද යන්න ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් සමීක්ෂණය කොට එම සමීක්ෂණ දත්ත අනුව ඉතිරි ඉල්ලීම් සඳහා ඉල්ලුම් කළ අනුපිළිවෙලට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන සිසුසැරිය සේවාවට පමණක් සිසුසැරිය අවසර පත්‍ර නිකුත් කිරීම හා සිසුසැරිය ව්‍යාපෘතිය සඳහා ගිවිසුම් අත්සන් කිරීම.

15. ඉහත විස්තර කළ පරිදි අන්තර් පළාත් සිසුසැරිය සේවා සඳහා ධාවකයන් ඉදිරිපත් නොවී පාසල් හෝ දෙමාපියන් විසින් අන්තර් පළාත් ගමන් ගන්නා දරුවන්ට පාසල් බස්රථයක් සපයන ලෙස ජාතික ගමනාගමන කොමිෂන් සභාවට ඉල්ලීම් කළහොත් එම ඉල්ලීම් වෙනම ලේඛනයක ( මෙම ලේඛණය ලේඛන අංක 02 ලෙස නඩත්තු කිරීම) ලේඛනගත කර ගැනීම සහ ලේඛනගත කරගත් අනුපිළිවෙලින් එම සේවාවන්ට බස්රථයක් යොදන ලෙස ඉල්ලීම් කර ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත ලිඛිතව දැනුම් දීම.
16. දැනුම්දුන් සිට දින 14ක් තුල ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් බසරථයක් යෙදවීම සිදු නොකළහොත් එම ඉල්ලීම සඳහා පෞද්ගලික ධාවකයන්ට ඉදිරිපත් වන ලෙස දන්වා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ දැන්වීමක් පල කිරීම.
17. ඒ මගින් ඉදිරිපත් වන ධාවකයින් ඉහත සඳහන් කළ ලේඛන අංක 01 හි පැමිණෙන අනුපිළිවෙල අනුව ලේඛනගත කර ගැනීම සහ ඉහත පියවර අනුගමනය කරමින් සිසුසැරියට පමණක් සිසුසැරිය අවසර පත්‍රයක් නිකුත් කර සිසුසැරිය ව්‍යාපෘයට අනුයුක්ත කර ගැනීම සඳහා ගිවිසුම් අත්සන් කිරීම.
18. ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සිසුසැරියට පමණක් නිකුත් කරන ලද සිසුසැරිය අවසර පත්‍රයක් පදනම් කරගෙන කිසිදු අවස්ථාවක සාමාන්‍ය මගී ප්‍රවාහනයට බස්රථය යෙදවිය නොහැකි බවත් එම සිසුසැරිය අවසර පත්‍රය පදනම් කරගෙන සාමාන්‍ය මගී ප්‍රවාහනයේ අවසර පත්‍රයක් ලෙස සංශොධනය කිරීමට කිසිදු අවස්ථාවක ඉල්ලීම් කළ නොහැකි බව සිසුසැරිය අවසර පත්‍ර යේ කොන්දේසි වලට ඇතුලත් කිරීම.
19. අන්තර පළාත් සිසුසැරිය සේවා සඳහා යොදවනු ලබන බස්රථ සාමාන්‍ය හෝ සුඛෝපභෝගී බස්රථ විය හැකි අතර සුඛෝපභෝගී බස්රථ සඳහාද ක.මී. 01කට රු. 105.00 බැගින් මහා භාණ්ඩාගාරය විසින් අනුමත කර ඇති මුදල පමණක් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ගෙවීම් කිරීම. කිලෝ මීටර් 01කට ගෙවනු ලබන සහනාධාර මුදල ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ගණනය කරනු ලබන බස්රයක කිලෝ මීටර් 01ක ධාවන පිරිවැය අනුව සංශෝධනය වේ.
20. අන්තර් පළාත් සිසුසැරිය සේවා සඳහා මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේදී අනුගමනය කරන ඉහත පියවර සහ කොන්දේසි සියලු ජනතාවගේ දැන ගැනීම පිණිස ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය හරහා ප්‍රසිද්ධ කිරීම.